# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
## சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
## Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/09/CBO/ | | 2017/07/11 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,

මූලස්ථාන සමෘද්ධි කළමනාකරුන්,

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම</u>**

**සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි අංක ලබා දීම**

සමෘද්ධි චක්‍රලේඛ ප්‍රජාමූල/02/2017/02 හා 2017/05/20 දිනැති චක්‍ර ලේඛය මඟින් 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 09වන වගන්තිය මඟින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම සඳහා අංක 2009/08 හා 2017/03/07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4(2) ඡේදයට අනුව කටයුතු කිරීම පිණිස වන උපදෙස් ලබා දී ඇත.

02. එකී චක්‍රලේඛයේ අංක 02 යටතේ පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සඳහා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගැසට් පත්‍ර යේ 04(1) (අ) අනුව සකස්කර ගන්නා ලද ව්‍යවස්ථාව හා පරිපාලන ව්‍යුහය අනිකුත් ලේඛන සමඟ 2017 ජූනි මස 07 වන දිනට ප්‍රථම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ලේකම්වරයා විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් එකී සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත භාර දෙන ලෙස උපදෙස් ලබා දී ඇත.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 2009/08 හා 2017/03/07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 4(03) ඡේදයට අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් සඳහාම ව්‍යවස්ථාව හා පරිපාලන ව්‍යුහයට අදාල ලේඛන භාරගත් පසු සෑම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් සඳහාම සහතිකයක් අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙනුවෙන් එකී සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රජා මූල සංවිධාන යේ සභාපතිවරයා වෙත නිකුත් කල යුතු වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |


D/Manori new/KUMARI miss/ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි අංක ලබා දීම

මෙම සහතිකයේ ලියාපදිංචි අංකය ඇතුළත් කලයුතු වේ. ලියාපදිංචි අංකය සකස් කිරීමේදී

01. දිස්ත්‍රික් අංකය (පළාත් අංකය සමග)

02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අංකය

03. බැංකු කලාප අංකය

04. ග්‍රාම සේවා වසම් අංකය

05. CBO - අනුක්‍රමික අංකය

වශයෙන් අනුපිළිවෙලට සකස්කර ගතයුතු වේ. එම අංකය සකස් කර ගැනීම සඳහා පහත නිදසුන අධ්‍යනය කර ප්‍රජාමූල සංවිධාන සඳහා ලබා දෙන ලියාපදිංචි අංකය සකස්කර ගැනීම සඳහා අදාල නිලධාරින් වෙත උපදෙස් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

| පළාත | අංකය | දිස්ත්‍රික්කය | අංකය | ප්‍රා.ලේ.කො. | අංකය | බැංකු කලාපය | අංකය | ග්‍රාම නිලධාරි වසම | අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1 | කොළඹ | 1 | කොළඹ | 03 | මැදකොළඹ (I) | 1 | ග්‍රෑන්ඩ්පාස් උතුර | 80 |
| | | | | | | | | ග්‍රෑන්ඩ්පාස් දකුණ | 75 |
| | | | | | | | | ජින්තුපිටිය | 60 |
| | | | | | | මැදකොළඹ (II) | 2 | | |
| | | | | | | උතුරු කොළඹ | 3 | | |
| | | ගම්පහ | 2 | අත්තනගල්ල | 27 | වේයන්ගොඩ | 4 | එළුවාපිටිය | 10 |
| | | | | | | | | හීන්දෙණිය | 150 |
| | | | | | | | | මහලෙගොඩ | 140 |
| | | | | | | නිට්ටඹුව | 5 | | |
| | | | | | | රන්පොකුණුගම | 6 | | |
| | | කළුතර | 3 | ඉංගිරිය | 10 | ඉංගිරිය | 1 | දොඹගස්කන්ද | 145 |
| | | | | | | | | ඉංගිරිය උතුර | 90 |
| | | | | | | | | මහ ඉංගිරිය | 70 |
| | | | | | | පෝරුව දණ්ඩ | 2 | | |
| | | | | | | හඳපාන්ගොඩ | 3 | | |

උදා:- ඉහත වගුවෙහි කළු කර ඇති සංඛ්‍යා අනුව මෙම ලියාපදිංචි අංකය නිර්මාණය වී ඇත.

- **1-1-03-1-80 =** ග්‍රෑන්පාස් උතුර
- **1-2-27-4-10 =** එළුවාපිටිය
- **1-3-10-1-145 =** දොඹගස්කන්ද

මෙම අංක පිළිබඳ සැලකිල්ලට ගෙන එක් එක් දිස්ත්‍රික්කයේ සමෘද්ධි මූලස්ථාන බල ප්‍රදේශ වලට අයත් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සඳහා ලියාපදිංචි අංකය ලබාදිමේදී මූලස්ථාන සමෘද්ධි කළමනාකරු වෙත අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙම අංක වලට පසුව CBO-001 සිට අංක ලබා දිය යුතුවේ. (එනම් මුලින්ම ලැබෙන අයදුම් පත්‍රය CBO-001 වන අතර එතැන් සිට CBO-002,CBO-003 ආදි වශයෙන් වේ. ) ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචි අංක පහත නිදසුන් පරිදි සකස් කර ගතයුතු වේ. **(මෙම අංක සකස් කර ගැනීම සඳහා ලොතැරැයි ඇදීම සඳහා භාවිතා කරනු ලබන ක්ෂේත්‍ර අංක පිළිවෙල භාවිතා කරන්න.)**

| **සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය** | **ලියාපදිංචි අංක පිළිවෙල** |
|---|---|
| **කොළඹ** | |
| 1. ග්‍රෑන්ඩ්පාස් උතුර | 11-03-1-80 – CBO - 001 |
| 2. ග්‍රෑන්ඩ්පාස් දකුණ | 11-03-1-75 – CBO - 002 |
| 3. ජින්තුපිටිය | 11-03-1-60 - CBO - 003 |
| **ගම්පහ** | |
| 1. එළුවාපිටිය | 12-27-4-10 - CBO - 001 |
| 2. හීන්දෙණිය | 12-27-4-150 - CBO -002 |
| 3. මහලෙගොඩ | 12-27-4-140 - CBO -003 |
| **කළුතර** | |
| 1. දොඹගස්කන්ද | 13-10-1-145 - CBO -001 |
| 2. ඉංගිරිය උතුර | 13-10-1-90 - CBO -002 |
| 3. මහ ඉංගිරිය | 13-10-1-70 – CBO – 003 |

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන්නාවූ සහයෝගයඉතා අගය කොට සලකමි.

පී.ආර්.ඩී.එච්. අනුරවංශ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ,
ප්‍රජාමූල සංවිධාන අංශය
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

**ඇමුණුම -01**

| | | | |
|---|---|---|---|
| පළාත → | | බස්නාහිර පළාත (1) | |
| දිස්ත්‍රික්කය → | කොළඹ (1) | ගම්පහ (2) | කළුතර (3) |
| ප්‍රා.ලේ.කො. → | කොළඹ - 03 | අත්තනගල්ල - 27 | ඉංගිරිය - 10 |
| බැංකු කලාප අංකය → | මැද කොළඹ (I) - 1 | වේයන්ගොඩ - 4 | ඉංගිරිය - 1 |
| | මැද කොළඹ (II) - 2 | නිට්ටඹුව - 5 | පෝරුව දණ්ඩ - 2 |
| | උතුරු කොළඹ - 3 | රන්පොකුණුගම - 6 | හඳපාන්ගොඩ - 3 |
| | **මැද කොළඹ (I)** | **වේයන්ගොඩ** | **ඉංගිරිය** |
| ග්‍රාම සේවා වසම් → | ග්‍රෑන්ඩ් පාස් උතුර - 80 | එළුවාපිටිය - 10 | දොඹගස්කන්ද - 145 |
| | ග්‍රෑන්ඩ් පාස් දකුණ - 75 | හීන්දෙණිය - 150 | ඉංගිරිය උතුර - 90 |
| | ජින්තු පිටිය - 60 | මහලෙගොඩ - 140 | මහ ඉංගිරිය - 70 |